# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/24 - 2016 අගෝස්තු මස 31 වැනි බදාදා - 2016.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 2016/03
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2015/එච්ඩබ්ලිව්/270.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සූරියවැව ගමේ, අංක. 109, අන්දරවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2016.06.30 දිනැතිව පිළියෙල කරන ලද අවසාන හුලක්ෂණාත්මක පිඹුරු අංක. 4 හි අතුරු පිඹුරු අංකය. 374, පත්‍ර අංකය. 594 පිඹුරේ කැබලි අංක. ඩී 8712 සිට ඩී 8713 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.7525 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (01):

01. කැබලි අංක. ඩී 8712

ඉඩමේ නම: පහල අන්දරවැව කැලේ; ඉඩමේ විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: - (ඩී 8711 වැනි බිම් කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 1.7525.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවළුන් හෝ 2016.09.22 වැනි දින පෙරවරු 9.30 ට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016.09.29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

නාමල් ලියනගේ,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2016 අගෝස්තු මස 29 වැනි දින,
සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

09-613


1A - G 24155- 08 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.